

පෙළ අටුවාව සහිත

# අග්ගික්ඛන්ධෝපම සූත්‍රසන්නය

පෙළ අටුවාව සහිත

# අග්ගික්ඛන්ධෝපම සූත්‍රසන්නය.

උගත් ස්වාමීන්වහන්සේ කෙනෙක් ලවා ශුද්ධකරවාගෙන

වල්ගම

ඇල්. ඞී. පේද්‍රික් අප්පුහාමි විසින්

අච්චුගස්වා ප්‍රසිද්ධකරනලදී.

පෑලියගොඩ

සේවකශ්‍රී යන්ත්‍රාලයෙහි අච්චුගසනලදී.

1900.

# අග්ගික්ඛන්ධොපම සූත්‍රසන්නය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

එවමෙම්සුතං එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්ඛු සංඝෙන සද්ධිං අද්දසාඛො භගවා අද්ධානමග්ග පටිපන්නො අඤ්ඤතරස්මිං පදෙසෙ මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං දිස්වා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි.

යනාමේ පාඨය බුද්ධභාෂිතය, ශ්‍රාවකභාෂිතය, ඍෂිභාෂිතය, දෛවභාෂිතය යන් චතුර්විධ භාෂිතයන් අතුරෙන් කවරභාෂිතයෙක්ද යත්?

අප බුදුරජාණන්වහන්සේ නිරුපධිශේෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පෑ මදළ අවුරුද්දෙහි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරප්‍රමුඛ සිව්පිළිසිඹියාපත් පන්සියයක් මහරහතන්වහන්සේලා රජගහනුවර සප්තපර්ණී ගුහාද්වාර සමීප මණ්ඩපයට රැස්ව පණවනලද ආසනවල වැඩහිඳ පළමුවෙනි ධර්මසංගායනාව කරණකාලයෙහි මේ සූත්‍රයට නිදානය විචාරණ මහා කාශ්‍යප ස්ථවිරයන්වහන්සේ විසින් ඇවැත්නි ආනන්දය, මේ අග්ගික්ඛන්ධොපම නාම් සූත්‍රාන්තදේශනාව කාරකෙනෙකුන් විසින් කොතැනකදී කවරකාලයකදී කියනලද්දේදැයි අසනලද ප්‍රශ්නයන් විසඳමින් මේ සූත්‍රයට නිධානය දක්වා ආනන්දමහතෙරුන්වහන්සේ විසින් මේ පාඨය වදාළහෙයින් ශ්‍රාවක භාෂිත නම් වේ.

මෙහි භාවාර්ථයනම්, මාවිසින් බුදුන්ගේ සමීපයෙන් මෙසේ අසන ලදී-එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ කොසොල්ජනපදයෙහි මහත් භික්ෂු සමූහයා හා සමග සැරිසරා වඩිනාසේක; භාග්‍යවතුන්වහන්සේ දීර්ඝ මාර්ගයට පිළිපන්සේක් එක්තරා ප්‍රදේශයක ගිණිගෙණ දිලිසෙනනාවූ මහාව ඇවිලෙන්නාවූ ගිණිදැල් සහිතවූ මහත්වූ ගිණිකඳක් දුටුසේක. ඒ දැක මාර්ගයෙන් ඉවත්ව එක්තරා ගසක්මුල පණවනලද ආසනයෙහි වැඩහුන්සේක; වැඩහිඳ වනාහි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකළසේක; හෙවත් අඬගසා වදාළසේක.—මේ සංක්ෂෙපාර්ථයි.

මේ සූත්‍රයෙහි උත්පත්ති කථාව ප්‍රකාශකරණුලැබේ. එහ් කෙසේ දයත්? මනොරථපූරණීනම් අඞ්ගුත්තරඅට්ඨකථාවෙහි "භගවා කිර එකං සමයං සාවත්ථියං උපනිස්සාය ජේතවනමහාවිහාරෙ පටිවසති බුද්ධානඤ්ච යස්මාකඤ්ච පටිවසන්තානං පච්චවෙක්ඛණං අභිජානිතමෙව හොති" යනාදී අටුවා පාඨයෙහි අභිප්‍රාය මෙසේයි. භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ වනාහි එක්කලෙක්හි සැවැත්නුවරනිසා ජේතවනමහාවිහාරයෙහි වාසයකරණසේක. යම්කිසි තැනෙක්හි වැඩවාසයකරණ බුදුවරයින්ගේ නොහරිනලද පෙරබත පසුබත පෙරයම මැදුම්යම අළුයම යන පචප්‍රකාර බුද්ධකෘත්‍යයක්ම වේ. එදවසද භාග්‍යවතුන්වහන්සේ අළුයමයයි කියන මේ පශ්චිමයාම බුද්ධකෘත්‍යයෙහි සිට බුදුඇසින් ලොවබලන්සේක් මේ කාරණය දුටුසේක. කොසොල්රටෙහි සැරිසරණ මාවිසින් ගිනිකඳ හා සමග උපමාකොට එක්සූත්‍රයක් දෙසූකල්හි සැටනමක් භික්‍ෂූහු රහත්බවට පැමිණෙන්නාහුය; සැටනමක් පමණ භික්‍ෂූන්ගේ මුඛවලින් උනුලේවමණය වන්නාහුය; සැටක් පමණ භික්‍ෂූහු ගිහිබවට පැමිණෙන්නාහුය; එහි යම් භික්‍ෂුහුකෙණෙක් රහත්බවට පැමිණෙද්ද ඒ භික්‍ෂූහු කිසි ධර්මදෙශනාවක් අසා රහත්වන්නාහුමය; අනිකුදු භික්‍ෂූන්ට සංග්‍රහය පිණිස හෙවත් උපකාරපිණිස ජනපද චාරිකාවෙහි හැසිරෙණුකැමතිවී එබා ආනන්දය භික්‍ෂූන්ට කියවයි වදාළසේක.

ආනන්දස්ථවිරතෙම පිරිවෙනක් පාසා ගොස් ඇවැත්නි සර්වඥයන්වහන්සේ මහජනයාට සංග්‍රහය පිණිස චාරිකාවෙහි හැසිරෙණුකැමතිසේක; එනුකැමති භික්‍ෂූහු එත්වයි කියේය; භික්‍ෂූහු මහත්ලාබයක් ලැබුවාක්මෙන් මහජනයාට බනවදාරණ බුදුන්ගේ රන්වන්වූ ශරීරය බලන්නටද මිහිරිවූ බණ අසන්නටද ඒකාන්තයෙන් ලබන්නෙම්නයි කියා සතුටුසිත්ඇතිව දික්වූ ඉසකෙස් ඇති භික්‍ෂූහු ඉසකෙස් බා මලබැඳිපාත්‍ර පිස කිලුටුසිවුරු ඇතිඅය සිවුරු ධෝවනය කොට ගමනට සැරසුනාහුය; ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මෙපමණයහී කියා ගණන්නැති භික්‍ෂුසමූහයා විසින් පිරිවරණලද්දුව කොසොල්රට ගම්නියම්ගම් පිළිවෙළින් චාරිකාවෙහි නික්මුනුසේක. එකදවසකට ගව්වක් දෙගව්වක් තුන්ගව්වක් සතරගව්වක් පමණ සැරිසරණසේක් එක් ප්‍රදෙශයෙක්හි හෙවත් එක් භූමිභාගයෙක්හි මහත් සිදුරුඇති වෘක්ෂයක් ගින්නෙන් දිලිසෙන්නා දැක ඒවසතු කොට පහවත් කරුණුකොට සත් අහසකින් ප්‍රතිමණ්ඩිතකොට බණකියන්නෙම් කියා වඩිනාගමන නවත්වා එක්තරා ගසක්මුලට එළඹ වැඩනිඳිනා ආකාර දක්වූයේය; ආනන්දස්ථවිරතෙම බුදුන්ගේ අදහසදැන ඒකාන්තයෙන් කරුණක්වන්නේය; නිකරුණේ බුදුවරයෝ ගමණ නවත්වා වැඩනොහිඳින්නාහුයයි සිතා සඟල සිවුර

සතරපටක් කොට පැණවූයේය; ශාස්තෲන්වහන්සේ එහි වැඩහිඳ භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට “පස්සථනො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛන්ධං” යනාදීන් අග්ගික්ඛන්ධොපම සූත්‍රදෙශනාව වදාළසේක; මේ නිග්‍රාථක හෙවත් ගාථාහැති සූත්‍රය වදාළකල්හි සැටක්පමණ භික්ෂූන්ගේ මුඛවලින් උනුලේ වමනය වූයේය.

සැටක්පමණ භික්ෂූහු සිවුරුහැර ගිහිවූවාහුය, සැටක්පමණ භික්ෂූන්ගේ සිත් ආශ්‍රවයන් කෙරෙන් මිදුනාහුය; ඒ නිග්‍රාථක සූත්‍රය අසා සැටක්පමණ භික්ෂූන්ගේ සිතකය දෙක තැවී නිධාන්ගත උනුලේ මුඛවලින් නික්මුනේය; සැටක්පමණ භික්ෂූහු භාග්‍යවතුන්ව හන්ස බුදුයස්නෙහි ජීවිතාන්තය දක්වා සම්පූර්ණව පිරිසිදුව බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නට අතිශයින් දුස්කරයයි කියා ගිහිවූවාහුය; සැටක් පමණ භික්ෂූහු බුදුන්ගේ දෙශනාවට අභිමුඛව ඥානය යවා සිව් පිළිසිඹියාව හා සමඟ රහත්බවට පැමිණියාහුය; එහි යම් භික්ෂූකෙනෙකුන්ගේ මුඛවලින් උනුලේ නික්මුණේද ඒ භික්ෂූහු පාරාජිකාපත්තියට පැමිණියෝය; යමක්හු ගිහිබවට පැමිණියාහුද ඒ පුද්ගලයෝ තෙලෙස්සංඝාදි සේසාදි ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද මඩිමින් හැසුරුණාහුය; යම් භික්ෂූහු රහත්වූවාහුද ඒ භික්ෂූහු පිරිසිදු සිල්වත්වූවාහුය; ශාස්තෲවූ බුදුන්ගේ ධර්මදෙශනාව මේ පුද්ගලයන් තුන්කොටසටම සාර්ථකවූවාය; රහත්බවට පැමිණි ආර්‍ය්‍යයන් වහන්සේලාට සඵලවේවා, අනිත් දෙකොටසට කෙසේ සාර්ථකවූවාහුද? ඒ පුද්ගලයෝ වනාහී ඉදින් මේ ධර්මදෙශනාව නොඇසුවාහුනම් ප්‍රමාදව සිටි භූමිය හෙවත් උපසම්පන්නය යන කල්පනාව හරිනනාව නොහැකිවූවාහුනම් එයින් නොහොත් ඒ කල්පනාවෙන් ඔවුන්ට ඒ අකුසල් වැඩෙමින් අපායෙහිම ගිලෙන්නේය; ඒ ධර්මදෙශනාව අසා කල කිරීම ඉපදී උපසම්පදා යන කල්පනාව හැර සාමණේර භූමියෙහි සිට දසසිල් පුරා නුවනින්යෙද් කිසිවෙක් සොවාන්වූවාහුය; කිසිවෙක් සකෘදගාමිවූවාහුය; කිසිවෙක් අනාගාමිවූවාහුය; කිසිවෙක් දිව්‍යලෝකයෙහි උපන්නාහුය; මෙසේ පාරාජිකාවට පැමිණියවුන්ටද සාර්ථකවූවාය අනිකුදු පුද්ගලයෝ වනාහී මේ දෙශනාව නොඇසුවාහුනම් කල් යත් යත් සංඝාදිසෙස ආපත්තියටද පාරාජිකාපත්තියටද පැමිණෙන්නාහුය; මේ අග්ගික්ඛන්ධොපම ධර්මදෙශනාව වනාහී අසා බුදුසස්න අනන්‍යනෛර්‍ය්‍යානිකවේ. අපි වනාහී දිවිහියනතෙක් මේ ශ්‍රමණ ප්‍රතිපත්ති පුරන්නට නොහැක්කාම්හ උපසම්පදා ශික්ෂාව හැර උපාශකධර්මය පුරා දුකින් මිදෙම්හයි කියා ගිහිබවට පැමුණුනාහුය: ඒ ගිහියෝ තිසරණයෙහි පිහිටා පන්සිල්රැක උපාසක ධර්මය පුරමින් කිසිවෙක් සෝවාන්වූවාහුය; කිසිවෙක් සකෘදගාමිවූවාහුය; කිසිවෙක් දිව්‍යලොකයෙහි උපන්නාහුයයි මෙසේ මේ දේශනාව

ඒ තුන්කොටසටම සඵලවූවාය; හෙවත් ඵැඩසිදුකළෝය; මේ අර්ථ
කථාවෙහි කියාතිබෙන පරිද්දෙන් සතරපාරාජිකාවට පැමිණි භික්ෂු
හුද තමතමන්ගේ උපසම්පන්නභාවය යන කල්පනාව හැර සාමණෙරව්
ඹනාකොට දසසිල්රැකීමෙන් හෝ ගිහිව තිසරණ පන්සිල් ආදිය
රැකීමෙන් ස්වර්ගමොක්ෂ සම්පත් ලැබෙනබව ප්‍රකාශවේ. මේ සූත්‍ර
යෙහි මුලකී ශ්‍රාවකපාඨයෙහි සංක්ෂෙපාර්ථය සහ උත්පත්ති කථාව
මෙලෙසින් දක්වා නැවත දෙශනාපාලියෙහි අර්ථ කියනුලැබේ.

“ පස්සථ නොතුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදි
ත්තං සම්පජ්ජලිතං සජොතිභූතන්ති එවම්භන්තෙ ” මහණෙනි ගිනි
ගෙණ දිලිහෙන්නාවූ මනාකොට ඇවිලෙන්නාවූ ගිණිදූල් සහිතවූ
මේ මහත් ගිණිකඳ තෙපි බලව්දැයි විචාළසේක; භික්ෂූහු ස්වාමීන්
වහන්ස එසේ බැළුයෙම්හයි කියා සැළකළාහුය; “ තං කිම්මඤ්ඤථ
භික්ඛවෙ කතමං නුඛො වරං යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදි
ත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍යවා උපනි
පජ්ජෙය්‍යවා යං ඛත්තිය කඤ්ඤංවා බ්‍රාහ්මණ කඤ්ඤංවා ගහපති
කඤ්ඤං වා මුදුතළුනහත්ථපාදං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනි
පජ්ජෙය්‍යවාති එතදෙවභන්තෙ වරං යං ඛත්තිය කඤ්ඤංවා බ්‍රාහ්ම
ණකඤ්ඤං වා ගහපතිකඤ්ඤං වා මුදුතළුනහත්ථපාදං ආලිඞ්ගිත්වා
උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා දුක්ඛං හෙතං භන්තෙ යං අමුං
මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොති භූතං ආලිඞ්ගි
ත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍යවාති ”.

මහණෙනි, තෙපි කුමක්සිතව්ද ගිණිගෙණ දිලිහෙන්නාවූ මනාව
ඇවිලෙන්නාවූ ගිණ්දූල් සහිතවූ මේ මහත් ගිණිකඳ වැළඳගෙණ
හිඳිනේ හෝ වේද සැතපෙන්නේ හෝ වේද යන යමක් ඇද්ද මෘදුවූ
සිව්මැලිවූ අත්පා ඇති ක්ෂත්‍රියකණ්‍යාවක් හෝ බ්‍රාහ්මණකන්‍යාවක්
හෝ ගෘහපතිකන්‍යාවක් හෝ වැළඳගෙණ හෙවත් ස්පර්ශකොට හිඳි
නේ හෝ වේද සැතපෙන්නේ හෝ වේද යන යමක් ඇද්ද එයින්
කවර කරුනක්වනාහි උතුම්දැයි විචාළේය; භාත්පසින් දිලිහි දිලිහී
ඇවිලෙන මහත් ගිණිකඳ බදගණහිඳීම උතුම්ද ක්ෂත්‍රියාදී උතුම්
කන්‍යාවක් හා සමග සැතපීම උතුම්දැයි කියා භික්ෂූන්ගෙන් අසා
වදාළසේක; ස්වාමින්වහන්ස මෘදුවූ සිව්මැල්වූ හස්තපාදඇති යම්
ක්ෂත්‍රියකන්‍යාවක් හෝ බ්‍රාහ්මණකන්‍යාවක් හෝ ගෘහපතිකන්‍යාවක්
හෝ වැළඳගන හිඳිනේ හෝ වේද සැතපෙන්නේ හෝ වේද, මේ
කාරණයම උතුම් වේ, ස්වාමීන්වහන්ස දිලිහෙන්නාවූ මනාව ඇවි
ලෙන්නාවූ ගිණිදූල් සහිතවූ යම් මේ මහත් ගිණිකඳ වැළඳගණ
හෙවත් බදා අල්වාගෙණ හිඳිනේ හෝ වේද; සැතපෙන්නේ හෝ

වේද, මේ කාරණය විනාශී දුක්වන්නේය; ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි යෞවන කන්‍යාවන් හා සමග සැතපීම උතුම් බවද ගිනිකඳ වැලඳගැණීම ඉතා දුක්යයි කියා භික්ෂූනු බුදුන්ට සැලකළාහුය.

"ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචි සංකස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අස්සමණස්ස සමණපටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරි පටිඤ්ඤස්ස අන්තොපූතිස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා; තං කිස්ස හෙතු? තතොනිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය යච ඛො සො භික්ඛවෙ දුස්සීලො පාපධම්මො අසුචි සංකස්සර සමාචාරො—පෙ— කසම්බුජාතො ඛත්තියකඤ්ඤං වා බ්‍රාහ්මණ කඤ්ඤං වා ගහපති කඤ්ඤං වා මුදුතලුනහත්ථපාදිං ආලිඞ්ගිත්වා උපනිසීදතිවා උපනිපජ්ජතිවා තං හිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති".

මහණෙනි, මම තොපට කියමි තොපට දන්වමි හෙවත් හඟවමි, යම් සේ ලාමක ස්වභාව ඇති අපවිත්‍රවූ සැකයෙන් සිහිකටයුතු හැසුරුම් ඇති සැඟවිය්‍යුතුවූ කායාදී කර්මඇති ශ්‍රමණගුනයක් නැත්තාවූ අශ්‍රමණව සිට ශ්‍රමණබව අඟවන්නාවූ බ්‍රහ්මචර්‍ය්‍යාවක් නැත්තාවූ අබ්‍රහ්මචාරිව සිට බ්‍රහ්මචාරිබව අඟවන්නාවූ දුස්සිල කමින් ඇතුළත කුනුවූ සදොරින් වැහෙන කෙලශයන්ගෙන් තෙත්වූ හටගත් රාගාදි කසළ ඇත්තාවූ සීලභෙදය කළහෙයින් දුස්සීලවූ ඒ දුස්සීලයාහට ගිණිගෙණ දිලිහෙන්නාවූ ප්‍රජ්වලිතවූ ජ්වලා සහිතවූ මේ මහත් ගිණිකඳ වැලඳගණ හිඳිනේ හෝ වේද, සැතපෙන්නේ හෝවේද යන යමක් ඇද්ද මෙම ගිණිකඳ වැලඳගැණීම උතුම්වන්නේය; ඊට කාරණා කවරේද? මහණෙනි ගිනිකඳ වැලඳගෙණ සැතපීම් ආදිය හේතුකොටගෙණ ඒ දුස්සිල මහණතෙම මරණයට හෝ පැමිණෙයි, මරණය හා සමාන දුකට හෝ පැමිණෙයි, ඒ ප්‍රත්‍යයෙන් හෙවත් ගිණිකඳ වැලඳගැණීමෙන් ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි නරකාදි සතරඅපායෙහි නූපදනේය; මහණෙනි පවිටුස්වභාව ඇත්තාවූ නොපිරිසිදු කායකර්මාදිය ඇති බැවින් සැකයෙන් සිහිකටයුතුවූ හැසුරුම් ඇත්තාවූ සැඟවියයුතු පව්කම් ඇත්තාවූ මහනකමක් නැත්තාවූ අශ්‍රමණව ශ්‍රමණබව අඟවන්නාවූ බ්‍රහ්මචරියාවක් නැත්තාවූ අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරිබව අඟවන්නාවූ කෙලශයන්ගෙන් ඇතුළත කුනුවූ චක්ෂුචාරාදි සදෙ

රින් වැහෙන කෙලශයන්ගෙන් තොත්මු කසල බඳු සවභාව ඇත්තාවූ යම් ඒ දුස්සීල මහණතෙම වනාහි මෘදුවූ සිවිමැලිවූ අත්පාඇති ක්‍ෂත්‍රිය කන්‍යාවක් හෝ බ්‍රාහමණකන්‍යාවක් හෝ ගෘහපතිකන්‍යාවක් හෝ වැලඳගෙණ හිඳිනේ හෝ අවිද, සැතපෙන්නේ හෝ වේද, මහණෙනි ඒ ක්‍ෂත්‍රියාදීන් වැලඳගැණීම වනාහි ඔහට බොහෝ කලකට අහිත පිණිස දුක් පිණිස වෙයි, ශරීරය බිඳීමෙන් මරණින් පසු නරකාදි සතරඅපායෙහි උපදනේය.

මෙනි අදහස බුදුරජානන්වහන්සේ භික්‍ෂුන්ට වදරණසේක්, මහණෙනි ඒ ශ්‍රමණ දුස්සිලසාහට ඇවිලෙන ගිණිකඳ වැලඳගෙණ ඉඳීම සැතපීම උතුම්ය එසින් මේ ජාතියෙහි මරණයට හෝ මරණය හා සමාන දුකට හෝ පැමිණෙනවා මිස අපායෙහි නූපදනේය; ඒ දුස්සිල මහණතෙම සත්‍රින් වැලඳගෙණ සැතපීම් ආදිය කිරීමෙන් මෙලොවදී නින්‍දාගර්හා අපහාස්‍යාදිය විඳැ මරනින්මතු අපායෙහි උපදනේයයි වදාළසේක.

මෙසේ ගිනිකඳ උපමාකොට සත්‍රින් පිලිබඳ පවකාම ගුණෙනි දුක් දක්වා මත්තෙහින් දුක් දක්වනසේක; "තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නුඛො වරං යං බලවාපුරිසො දළ්හාය වාලරජ්ජුයා උභො ජංඝෙ වෙඨෙත්වා ඝංසෙය්‍යසා ඡවිංඡින්දෙය්‍ය ඡවිංඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය චම්මංඡෙත්වා මංසං ඡින්දෙය්‍ය මංසංඡෙත්වා නහාරුං ඡින්දෙය්‍ය නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය අට්ඨිංඡෙත්වා අට්ඨිංමිඤ්ජං ආහච්ච තිඨෙය්‍ය සංඛත්තිය මහාසාලානං වා බ්‍රාහමණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍යාතිං" මහනෙනි තෙපි ඒ කුමකැයි සිතව්ද? බලඇති පුෂියෙක් යම් දුස්සීලයෙක් අල්වාගෙණ දෘඪවූ කෘරවූ අස්රෝමාදියෙන් කරණලද රැහැණකින් ජඞගාදෙක හෙවත් සිහින් කෘතුල්දෙක වෙලා අදිද ඒ අදින රැහැණතොම සිවිය සිඳිනේය; සිවිය සිඳ සම සිඳිනේය; සම සිඳ මාංශ සිඳිනේය; මාස සිඳ නහරසිඳිනේය; නහරසිඳ ඇටසිඳිනේය; ඇටසිඳ ඇටමිදුළු පැහැරගෙණ සිටිනේය යන යමක් ඇද්ද ක්‍ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහමණ මහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ වැඳීම ඉවසන්නේයයි යන යමක් ඇද්ද මේදෙකින් කවරක් උතුම් දැයි භික්‍ෂුන්ගෙන් විචාරා වදාළසේක.—ඊට ප්‍රතිවචනදෙන භික්‍ෂූහු—

"එතදෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහමණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍ය දුක්ඛං හෙතං භන්තෙ යංබලවා පුරිසො දළ්හාය වාලරජ්ජුයා—පෙ—අට්ඨිමිඤ්ජං ආහච්ච තිඨෙය්‍යාති ආරොචයාමි, වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්සවරං—පෙ—කසඹු ජාතස්ස යං බලවා පුරිසො දළ්හාය රජ්ජුයා උභොජංඝෙ වෙඨෙත්වා—පෙ—

අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය; තං කිස්ස හෙතු? තතො නිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං න ත්වෙව තප්පච්චයා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය යො ච ඛො සො භික්ඛවෙ දුස්සීලො—පෙ—කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අභිවාදනං සාදියති තං හිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති".

ස්වාමීන්වහන්ස ක්ෂත්‍රියබ්‍රාහ්මණ ගෘහපති මහාසාරයන්ගේ වැඳීම් ඉවසන්නේයයි යන යමක් ඇද්ද මෙම වැඳීම් ඉවසීම උතුම් වේ, ස්වාමීන්වහන්ස බලඇති පුරුෂයෙක් යමෙකු අල්වාගෙණ දැඩිවූ අස්රෝමාදියෙන් කළ රැහැනෙන් සිහින් කකුල්දෙක වෙලා අදීද ඒ රැහැන තොම ඡවිය සිඳින්නේය, ඡවිය සිඳ සම සිඳින්නේය, මස සිඳ මාංස සිඳින්නේය, මාංසසිඳ නහර සිඳින්නේය, නහරසිඳ ඇටසිඳින්නේය, ඇටසිඳ ඇටමිදුළු පැහැරගෙණ සිටින්නේයයි යන යමක් ඇද්ද? මේ කාරණය වනාහි දුක්වන්නේයයි සැලකළාහුය. මහණෙනි තොපට කියමි, මහණෙනි තොපට හඟවමි, යම්සේ පවිටු ස්වභාව ඇති අශ්‍රමණවූ සීලාදී ගුණයක් නැති නාමමාත්‍රයෙන් ශ්‍රමණ නම්වූ ඒ දුස්සීල ශ්‍රමණයා හට බලඇති පුරුෂයෙක් දැඩි කෲරවූ රැහැනකින් සිහින් කකුල්දෙක වෙලා අදින්නේද ඒ රැහැන තොම ඡවිය සම් මස් නහර ඇට සිඳ ඇටමිදුළු පැහැරගෙණ සිටින්නේයයි යන යමක් ඇද්ද මෙම කාරණය උතුම් වේ; ඊට කාරණා කවරේද? මහණෙනි, ඒ දුස්සීල මහණ තෙම ඒ රැහැනෙන් කැපීම කරණකොට ගෙණ මරණයට හෝ මරණයහා සමාන දුකට හෝ පැමිණෙයි, ඒ වේදනාවෙන් මරණින් පසු නරකාදී සතර අපායෙහි නූපදනේය.

මහණෙනි, ලාමක ස්වභාව ඇති සීලාදි ගුණයෙන් විරහිතව කාසායවස්ත්‍ර පමණක් දරන්නාවූ ඒ ශ්‍රමණ දුස්සිල තෙම ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපතීන්ගේ වැඳීම ඉවසාද, මහණෙනි ඒ දුස්සිලයා හට වැඳීම ඉවසීමෙන් බොහෝකලකට අහිතයට දුඃඛයට කාරණාවන්නේය; මරණින් පසු අපායෙහි උපදනේය; මෙහි අදහසනම්, යම් මහණෙක් දුස්සීලව සිව් ශ්‍රද්ධාවන්තයන්ගෙන් වැඳුම් ඉවසිමට වඩා කෲරවූ යොතකින් කකුල් වෙලා ඇදීමෙන් අපායෙහි නූපදවා මරණයට හෝ ඒ හා සමාන දුකට හෝ මේ ආත්මයෙහිදිම පැමිණෙන හෙයින් ඒ උතුම් වේ; වැඳුම් ඉවසීමෙන් හිත කය දෙකට දුක්දී අපායෙහි උපදින බව වදාළසේක.

"තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො වරං යං බලවා පුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍ය යං

ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අඤ්ජලිකම්මං සාදියෙය්‍යාති එතදෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අඤ්ජලිකම්මං සාදියෙය්‍ය දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍යාති";

මහණෙනි, ඒ කුමකැයි සිතව්ද බලඇති පුරුෂයෙක් තෙල් හනෙහි ගා මුවහත්කළ අඬයටියයැයි කියන ආයුධයකින් ලයමැද පහරින්නේය යන සමක් ඇද්ද ක්ෂත්‍රියබ්‍රාහ්මණ ගෘහපති මහසාරයන් හෝ දෙඅත නගා වඳින අඤ්ජලිකර්ම සංඛ්‍යාත ඇඳිලිබැඳීම ඉවසීම්ය යන යමක් ඇද්ද මේ දෙකින් කවරක් වනාහි උතුම්දැයි භික්ෂූන්ගෙන් විචාරා වදාළසේක; ඊට ප්‍රතිවචනදෙන භික්ෂූන්වහන්සේලා ස්වාමීන්වහන්ස ක්ෂත්‍රියබ්‍රාහ්මණ ගෘහපති යන ත්‍රිවිධ මහාසාරකුලයන්ගේ හෝ ඇඳිලිබැඳීම් ඉවසීම් යන මෙම කාරණය උතුම් වේ, බලඇති පුරුෂයෙක් තෙල්හනෙහි ගා මුවහත්කළ අඬයටියෙන් ළැමද හෙලා ඇනීමය යනමේ කාරණය දුක්යයි දැන්වූවාහුය; තියුනුවූ අඬයටිය කින් හෘදයව ඇනීමත් ශ්‍රද්ධාවන්තයින්ගේ අඤ්ජලිකර්මයයි කියන ඇඳිලිබැඳීමත් මේ දෙකින් සැපකොයිඑකද කියා විචාළවිට ඇඳිලි බැඳීම උතුම්බව කීවාහුය.

"ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එත දෙව තස්ස වරං දුස්සීලස්ස—පෙ—කසම්බුජාතස්ස යං බලවාපුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍ය තං කිස්ස හෙතු තතො නිදානංහි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණ මත්තං වා දුක්ඛං නත්වෙව තප්පච්චයා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො—පෙ—කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා—පෙ— අඤ්ජලිකම්මං සාදියති තංහිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති".

මහණෙනි තොපට මම කියමි තොපට මම හඟවමි යම්සේ ලාමක ස්වභාව ඇති අශ්‍රමණවූ ඒ දුස්සීලයාහට බලසම්පන්න පුරුෂයෙක් තියුණු ශස්ත්‍රයකින් හෘදය මධ්‍යයෙහි අනින්නේද මෙම ඇනීම උතුම්වේ; ඊට කාරණා කවරේද? මහණෙනි ඒ දුස්සීලතෙම ඒ ඇනීම් කරනකොටගෙන මරණයට හෝ මරනය හා සමානදුකට හෝ පැමිණෙයි ඒ වේදනාවෙන් මරණින් මතු අපායෙහි නූපදී

නේය, මහණෙනි ඒ ශ්‍රමණ දුස්සීලයනට ත්‍රිවිධමහාසාරකුලයන්ගේ හෝ ඇඳිලිබැඳීම් ආදිය ඉවසාද මහණෙනි ඒ දුස්සීලයානට ඒ ඉවසීම බොහෝකලකට අහිතය පිණිස දුඃඛයපිණිස වෙයි, මරණින් මතු නරකාදී සතරඅපායෙහි උපදනේය, තියුණු ශස්ත්‍රයකින් හෘදයට ඇනීමෙන් මෙලොව දුක්විඳිනවාමිස එයින් අපායට නොපැමිණෙයි; ශ්‍රද්ධාවන්තයින්ගේ අඤ්ජලිකර්ම ඉවසීමෙන් බොහෝකලක් හිතකය දෙකට දුක්දී කෙළවර නරකාදියෙහි උපදින්නේයයි වදාළසේක.

“තංකිංමඤ්ඤථ භික්ඛවෙ කතමංනුඛො වරං යං බලවා පුරිසො තණ්හෙන අයොපටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍ය යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍යාති එතදෙව භන්තෙ වරං යං ඛත්තියමහාසාලානං වා—පෙ—සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍ය දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසො තණ්හෙන අයොපටෙන ආදිත්තෙන—පෙ—කායං සම්පලිවෙඨෙය්‍යාති”.

මහණෙනි, ඒ කුමක් සිතවුද? බලඇති පුරුෂයෙක් ගිණිගෙණ දිලිසෙන්නාවූ හාත්පසින් ඇවිලෙන්නාවූ ගිණිදැල් සහිතවූ රත්වූ යපටකින් ශරීරය මනාකොට වෙලන්නේවේද යන යමක් ඇද්ද ක්‍ෂත්‍රියබ්‍රාහ්මණ ගෘහපති මහාසාර කුලයන් විසින් හෝ ශ්‍රද්ධාවෙන් දෙනලද සිවුරු වලඳින්නේයයි යන යමක් ඇද්ද මේ දෙකින් කවරක් වනාහි උතුම්දැයි විචාරා වදාළසේක; ඊට ප්‍රතිවචනදෙන භික්‍ෂූන් වහන්සේලා ස්වාමින්වහන්ස ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙනලද සිවුරු වැළඳීමම උතුම්වේ, ගිණිගෙණ දිලිහෙන රත්කරණලද යපටින් සියලු ශරීරය වෙලීමය යන යමක් ඇද්ද මේ කාරණය වනාහි දුක්වන්නේයයි සැලකළාහුය.

“ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස—පෙ—කසම්බුජාතස්ස බලවා පුරිසො තණ්හෙන අයොපටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍ය; තං කිස්ස හෙතු? තතොනිදානංහි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං නත්වෙව තප්පච්චයා කායස්සභෙදා—පෙ—නිරයං උප්පජ්ජෙය්‍ය යං ඛො සො භික්ඛවෙ—පෙ—කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා—පෙ—සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජති තං හිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති”.

මහණෙනි, තොපට කියමි තොපට හඟවමි යම්සේ ඒ ශ්‍රමණ දුස්සීලයාහට බලඇති පුරුෂයෙක් රත්වූ දිලිහෙන්නාවූ යපටකින් සියලු ශරීරය වෙළන්නේ වේද මෙම කාරණය උතුම්වේ, ඊට කාරණා කවරේද මහණෙනි ඒ දුස්සීලතෙම යපටින් වෙළීම කරණකොටගෙණ මරණයට හෝ මරණය හා සමාන දුකට හෝ පැමිණෙයි, ඒ ප්‍රත්‍යයෙන් මරණින් පසු නරකාදි අපායෙහි නූපදනේය; මහණෙනි ලාමකවූ අශ්‍රමණවූ ඒ දුස්සීලතෙම ත්‍රිවිධ මහාසාරකුලයන්ගේ සිවුරු වැළඳගන්නේද මහණෙනි ඒ ශ්‍රද්ධාවෙන් දෙනලද සිවුරු වැළඳගැණීම වනාහි ඒ ශ්‍රමණයාට බොහෝකාලයක් අහිත පිණිස දුක් පිණිස වෙයි, ඒ අකුසලයෙන් මරණින් පසු සතරඅපායෙහි උපදනේය; දුස්සීලව සිට දායකයින් විසින් දෙනලද සිවුරු ප්‍රයෝජන ගන්නවාට වඩා රත්වූ යකඩ පටියකින් ශරීරය වෙළීම කරණකොටගෙණ අපායෙහි නූපදවා මරණයට පැමිණීම උතුම්වේ, සැදැහැයෙන් දෙන සිවුරු පරිභොගකිරීමෙන් මෙලොවදී සිතකය දෙකට බොහෝ දුක්දී අපායෙහි උපදනේයයි වදාළසේක.

"තංකිම්මඤ්ඤථ භික්ඛවෙ කතමංනුඛො වරං යං බලවා පුරිසො තත්තෙන අයො සංකුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන මුඛං විවරිත්වා තත්තං ලොහගුලං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය තන්තස්ස ඔට්ඨම්පි ඩහෙය්‍ය මුඛම්පි ඩහෙය්‍ය ජිව්හම්පි ඩහෙය්‍ය කණ්ඨම්පි ඩහෙය්‍ය උරම්පි ඩහෙය්‍ය අන්තම්පි අන්තගුණම්පි ආදාය අධොභාගා නික්ඛමෙය්‍ය යංඛත්තිය මහාසාලානංවා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍යාති එතදෙව භන්තෙ වරං යංඛත්තිය —පෙ— සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍ය දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසො තත්තෙන අයො සංකුනා මුඛං විවරිත්වා තත්තං ලොහගුලං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං මුඛෙපක්ඛිපෙය්‍ය. තන්තස්ස ඔට්ඨම්පි ඩහෙය්‍ය—පෙ—අධොභාගා නික්ඛමෙය්‍යාති.

මහණෙනි, තෙපි ඒ කුමක්සිතව්ද? බලඇති පුරුෂයෙක් දිලිහෙන්නාවූ මනාකොට ඇවිලෙන්නාවූ ජ්වාලාසහිතවූ රත්වූ යකඩුවෙන් මුඛය විවෘතකොට ආදිප්තවූ සම්ප්‍රජ්වලිතවූ ජ්වාලා සහිතවූ ලොහොගුලියක් මුඛයෙහිබහාලාද එයින් ඔහුගේ ඔළුයද දන්නේය; මුඛයද දන්නේය දිවද දන්නේය; ග්‍රීවයද දන්නේය; ලයද දන්නේය; බඩවැලද දන්නේය අතුනුබහණද ගෙණ යටභාගයෙන් නික්මෙන්නේහෝ වේද, යන යමක් ඇද්ද ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් හෝ ශ්‍රද්ධාවෙන් දෙනලද පිණ්ඩපාතය වැළඳීමය යන යමක්ඇද්ද මේ දෙකින් කවරක් වනාහි උතුම්දැයි භික්‍ෂූන්ගෙන් විචාරා වදාළසේක; ඊට ප්‍රතිවචන

ශදන භික්ෂූන්වහන්සේ ස්වාමින්වහන්ස ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් හෝ දෙනලද පිණ්ඩපාතය වලඳන්නේයයි යන යමක් ඇද්ද ඒ පිණ්ඩපාතය වැලඳීම උතුම්වේ; ස්වාමින්වහන්ස බලඇති පුරුෂයෙක් රත්වූ යගඩුවකින් මුඛය විවෘතකොට රත්වූ දිලිහෙන්නාවූ ලොහොගුලියක් මුඛයෙහි තබන්නේවීනම් ඔහුගේ ඔෂ්ඨයද මුඛයද දිවද උගුරද බඩවැලද දන්නේය; අතුනුබහනද ගෙණ යටිභාගයෙන් නික්මෙන්නේයයි යන යමක් ඇද්ද මේ කාරණය වනායි දුක්වන්නේය; ශ්‍රද්ධාවන්තයින්ගේ පිණ්ඩපාතය කෑව උතුම්බවද රත්වූ ලොහොගුලි ගිලීම දුක්බවද සැලකළානුය.

"ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස —පෙ— කසම්බුජාතස්ස යං බලවා පුරිසො —පෙ— පක්ඛිපෙය්‍ය තත්තස්ස ඔඨම්පි ඩහෙය්‍ය —පෙ— අධොභාගා නික්ඛමෙය්‍ය; තංකිස්ස හෙතු? තතොනිදානංහි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා —පෙ— නිරයං උපපජ්ජෙය්‍ය යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො —පෙ— කසම්බුජාතො ඛත්තිය මහාසාලානං වා —පෙ— පිණ්ඩපාතං පරිභුඤ්ජති තංහිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතංනිරයං උපපජ්ජති''.

මහණෙනි, තොපට කියමි තොපට දන්වමි යම්සේ ඒ ශ්‍රමණදුස්සීලයාහට බලඇති පුරුෂයෙක් රත්වූ යගඩුවකින් මුඛය විවෘතකොට රත්වූ ලොහොගුලියක් මුඛයෙහි බහාලන්නේවීනම් ඔහුගේ ඔෂ්ඨය මුඛය උගුර හෘදය බඩවැල ද අතුනුබහනද ගෙණ යටිභාගයෙන් නික්මෙන්නේයයි යන මේ කාරණය උතුම් වේ; ඊට කාරණා කවරේද, මහණෙනි ඒ දුස්සීලතෙම ලොහොගුලි ගිලීම කරණකොට ගෙණ මරණයට හෝ මරණය හා සමාන දුකට හෝ පැමිණෙන්නේය; එයින් මරණින් මතු අපායෙහි නූපදනේය; මහණෙනි ඒ දුස්සීලතෙම ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙනලද පිණ්ඩපාතය වලඳාද මහණෙනි ඔහට ඒ පිණ්ඩපාතය වැලඳීම වනාහි බොහෝකලකට අහිත, පිණිස දුක්පිණිස වේ, මරණින් පසු අපායෙහි උපදනේය; මෙහි අදහස—රත්වූ ලොහොගුලි ගිලීමෙන් මරණය මිස අපාදුකක් නොලැබෙන බැවින් ඒ ලොහොගුලි ගිලීම උතුම් වේ, දුස්සිලව සිට ශ්‍රද්ධාවන්තයින් විසින් දෙනලද පිණ්ඩපාතය කෑමෙන් මෙලොවදී හිතකයදෙකට දුක්දී අපායෙහි උපදනේයයි වදාළ සේක;

තංකිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නුඛො වරං යං බලවා පුරිසො සීසෙවානහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා තත්තං අයොවචං වා අයොපීඨං වා ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අභිනිසීදාපෙය්‍ය වා

අභිනිපජ්ජාපෙය්‍ය වා යං ඛත්තියමහාසාලානං වා—පෙ—සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජෙය්‍යාති එතදෙව භන්තෙ වරං යං ඛත්තියමහාසාලානං වා—පෙ—පරිභුඤ්ජෙය්‍ය දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා—පෙ—අභිනිපජ්ජාපෙය්‍ය වා".

"ආරොචයාමි වො භික්ඛවෙ—පෙ—කසම්බුජාතස්ස යං බලවා පුරිසො සීසෙවා ගහෙත්වා—පෙ—අභිනිපජ්ජාපෙය්‍ය වා, තංකිස්සහෙතු? තතො නිදානංහි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං නත්වෙව තප්පච්චයා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො—පෙ—කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා—පෙ—සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජති තංහිස්ස භික්ඛවෙ හොති, දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්සභෙදා—පෙ—නිරයං උපපජ්ජති".

මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? බලඇති පුරුෂයෙක් ඉස හෝ කඳ හෝ අල්වාගෙණ ගිණිගෙණ දිලිහෙණ ලොහොඇඳක හෝ පුටුවක හෝ හිඳුවන්නේ හෝ වේද, හොවන්නේ හෝ වේද යන යමක්ඇද්ද ක්‍ෂත්‍රියමහාසාරාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙනලද ඇඳපුටු පරිභොගකරන්නේයයි යන යමක් ඇද්ද මේ දෙකින් කවරක් වනාහි උතුම් දැයි භික්‍ෂූන්ගෙන් විචාරා වදාළසේක; ඊට ප්‍රතිවචනදෙන භික්‍ෂූහු ස්වාමින්වහන්ස ක්‍ෂත්‍රියමහාසාරාදීන් විසින් සැදැහැයෙන් දෙන ලද ඇඳපුටු ප්‍රයෝජන ගැණීමය යන යමක් ඇද්ද මෙම කාරණය උතුම්වේ. බලඇති පුරුෂයෙක් ඉස හෝ කඳ හෝ අල්වාගෙණ රත්වූ ලොහො ඇඳපුටුවල ඉඳුවීම සැතපැවීමය යන මේ කාරණය වනාහි දුක්වන්නේය, මහණෙනි තොපට කියමි තොපට දන්වමි යම්සේ හීනසීලිවූ යථෝක්ත ශ්‍රමණ දුස්සීලයා හට බලඇති පුරුෂයෙක් ඉස හෝ කඳ හෝ අල්වාගෙණ ගින්නෙන් දිලිහෙන ලොහෝ ඇඳක හෝ පුටුවක හෝ ඉඳුවීම සැතප්පවීම කරවන්නේ හෝ වේද යන මෙම කාරණය උතුම් වේ, ඊට කාරණා කවරේද, මහනෙනි ඒ දුස්සීලතෙම ඒ ඇඳ පුටුවල ඉඳීම කාරණකොටගෙණ මරණයට හෝ මරණය සමාණ දුකට හෝ පැමිණෙයි ඒ වේදනාවෙන් මරණින්පසු අපායෙහි නූපදනේය; මහනෙනි ඒ දුස්සීලතෙම ක්‍ෂත්‍රියබ්‍රාහ්මනාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙනලද ඇඳපුටු ප්‍රයෝජන ගනිද මහනෙනි ඒ ඇඳපුටු ප්‍රයොජනගැණීම වනාහි ඔහට බොහෝකලකට අහිතය පිණිස දුඃඛය පිණිස වෙයි, මරණින්මතු අපායෙහි උපදනේයයි වදාළසේක.

"තංකිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නුඛො වරං යං බලවා පුරිසො උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය සොතත්ථ ඵේනුද්දේහකං පච්චමානො සකිම්පි උද්ධංගච්ඡෙය්‍ය සකිම්පි අධො ගච්ඡෙය්‍ය සකිම්පි තිරියං ගච්ඡෙය්‍ය යං ඛත්තියමහාසාලානං වා—පෙ—සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජෙය්‍යාති එතදෙව භන්තෙ වරං යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජෙය්‍ය දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසො උද්ධපාදං අධොසිරං ගහෙත්වා—පෙ—තිරියං ගච්ඡෙය්‍යාති".

"ආරොචයාමි වො භික්ඛවෙ—පෙ—යථා එතදෙව තස්සවරං දුස්සීලස්ස—පෙ—කසම්බුජාතස්ස යං බලවා පුරිසො උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය සොතත්ථ ඵේනුද්දේහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡෙය්‍ය සකිම්පි අධොගච්ඡෙය්‍ය සකිම්පි තිරියං ගච්ඡෙය්‍ය; තංකිස්සහෙතු? තතොනිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං නත්වෙව තප්පච්චයා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජෙය්‍ය යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො—පෙ—කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජෙය්‍යාති තංහිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති".

මහණෙනි, තෙපි ඒ කුමකැයි සිතව්ද? බලඇති පුෂියෙක් පා උඩුකුරුව ඉස යටකොට අල්වාගෙණ දිලිහෙන්නාවූ ප්‍රජ්වලිතවූ ගිණිදැල් සහිතවූ කකියනලද ලොහොකුඹුනරකයෙහි ප්‍රක්ෂෙපකෙරෙයි හෙවත් දමන්නේය; ඒ පුද්ගලතෙම එහි පෙනනගා පැසෙමින් එක්වරෙක උඩට නැගෙයි, එක්වරෙක යට බස්නේය; එක්වරක් සරසට යන්නේය; යන යමක් දැද්ද ක්ෂත්‍රියබ්‍රාහමණාදීන් විසින් හෝ ශ්‍රද්ධාවෙන් දෙනලද සෙනසුන් පරිභොග කරන්නේද යන යමක් ඇද්ද මේ දෙකින් කවරක් වනාහි උතුම්දැයි විචාරා වදාළසේක; ඊට ප්‍රතිවචනදෙන භික්ෂූන්වහන්සේලා ස්වාමින්වහන්ස ක්ෂත්‍රියබ්‍රාහමණාදීන් විසින් ශ්‍රද්ධාවෙන් පිළිගන්වනලද සෙනසුම් ප්‍රයෝජනගැනීමය යන මෙම කාරණය උතුම්වේ, ස්වාමින්වහන්ස බලවත් පුෂියෙක් පා උඩුකුරුව ඉස යටකොටගෙණ කකියන ලොහොකුඹු නරකයෙහි බහාලන්නේද හෙතෙම පෙන නගා පැසෙමින් එක්වරක් උඩට නැගෙයි එක්වරක් යටට යෙයි, එක්වරක් සරසට යන්නේයයි යන යමක් ඇද්ද මේ අතිසයින් දුක්වන්නේයයි දැන්වූවාය

සර්වඥයන්වහන්සේ භික්ෂූන්ට වදාරණසේක් මහණෙනි තොපට
කියමි තොපට දන්වමි යම්සේ ඒ දුශ්ශීලයාහට බල්ඇති පුරුෂයෙක්
අධඃශිරව අල්වාගෙණ කකියනලද ලෝහොයාගුඹු නරකයෙහි දමන්
නේද යන මෙම කාරණය උතුම්වේ. ඊංකාරණා කවරේද, මහණෙනි
ඒ දුශ්ශීලතෙම අපාදුක් කාරණකොටගෙන මරණයට හෝ ඒ හා
සමාන දුකට හෝ පැමිණෙන්නේය, එසින් නැවත අපායෙහි නූපද
නේය; මහණෙනි ලාමක සවිගාව ඇත්තාවූ නොපිරිසිදු කාය කර්මා
දිය ඇති බැවින් සැකයෙන් සිහිකටයුතු හැසුරුම් ඇත්තාවූ සඟව
නලද ක්‍රියා ඇත්තාවූ ශ්‍රමණ ගුණයක් නැත්තාවූ කිසිත් ගුණයක්
නැතිව කගරෙදිපමණයක් දරාගෙණ අපි මහණෝයයි කියා ශ්‍රමණ
ගුණ අඟවන්නාවූ මෛථුනසේවනාදියෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවක් නැත්
තාවූ අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරීබව අඟවන්නාවූ කෙලෙසයන්ගෙන්
ඇතුළත කුණුවූ රාගාදියෙන් තෙත්වූ හටගත් රාගාදි කසල ඇත්
තාවූ ඒ දුසිල මහණතෙම ක්ෂත්‍රියබ්‍රාහ්මණ ගෘහපති මහාසාර කුල
යන් විසින් ශ්‍රද්ධාවෙන් දෙනලද සෙනසුන් පරිභොග කෙරේද මහ
ණෙනි ඒ සෙනසුන් ප්‍රයෝජන ගැණීම වනාහි ඕහට බොහෝකලක්
අහිතපිණිස දුක්පිණිස වෙයි, ඒ අකුසලයෙන්ම මරණින් පසු නර
කාදි සතරඅපායෙහි උපදනේයයි වදාළසේක; "තස්මාතිහ භික්ඛ
වෙ එවං සික්ඛිතබ්බං යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවර පිණ්ඩපාත සෙනා
සන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං තෙසං තෙකාරා මහප්ඵලා
භවිස්සන්ති මහානිසංසා අම්හාකං චෙවායං පබ්බජ්ජා අවංඣා භවි
ස්සති සඵලාසඋදයාති එවංහි වො භික්ඛවෙ සික්ඛිතබ්බං".

මහණෙනි, දුසීලව සිටීමෙන් 'නොයෙක් දුක්දෙන බැවින් මේ
ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි මෙසේ හික්මියයුතුයි. අපි යම් ශ්‍රද්ධාවන්තා
කෙනෙකුන්ගේ සිව්රු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත්
ප්‍රයෝජන ගණිමුද ඔවුන්ගේ ඒ සත්කාරයෝ මහත්ඵල මහානි
සංස වන්නාහුද අපගේ මේ ප්‍රව්‍රජ්‍යාව සඵලව අභිවෘද්ධි සහිතව නිස්
නොවන්නේයයි කියා තොප විසින් මෙසේ හික්මිය යුතුයයි වදාළ
සේක; ශ්‍රද්ධාවන්තයින්ගේ සිව්පසය පිළිගන්නා භික්ෂූහු දායකයින්ට
ආනිසංස සලසාද තමන්ගේ ප්‍රව්‍රජ්‍යාව සඵලකරගැණීම සලකාද
හික්මිය යුතුයි.

"අත්තත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන
සම්පාදෙතුං පරත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමා
දෙන සම්පාදෙතුං උභයත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව
අප්පමාදෙන සම්පාදෙතුනති'.

මගඵලහනි ආත්මාර්ථීය හෝ බලන පුද්ගලයා විසින් අප්‍රමාදව ත්‍රිවිධ ශික්ෂාව සම්පාදනය කරන්නට සුදුසුවිය මිනතෙනි; පරාර්ථීය හෝ උභයාර්ථීය හෝ බලන්නහු විසින් ප්‍රමාද නොවීමෙන් ත්‍රිවිධ ශික්ෂාව සම්පාදනය කරන්නට යුක්තේමය; තමන්ට හෝ අනුන්ට හෝ වැඩකැමති මහණතෙම ප්‍රමාදනොව සීලාදිගුණ ධර්මයන් රක්ෂාකිරීම යුතුබව වදාළසේක.

ඉදමවොච භගවා ඉමස්මිංච වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡි සට්ඨිමත්තා භික්ඛූ සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිංසු දුක්කරං භගවා සුදුක්කරං භගවාති සට්ඨිමත්තානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තාං විමුච්චිංසූති.

බුදුරජානන්වහන්සේ අගහනයින් ප්‍රතිමණ්ඩිතකොට මේ අග්ගික්ඛන්ධොපම සූත්‍රාන්තධර්මදේශනාව මෙසේ වදාළසේක; මේ නිගීථක ධර්මදේශනාව වදාළකල්හි සැටක්පමණ භික්ෂූන්ගේ හෘදය තැවී උනුලේ මුඛවලින් නිගීතවූයේය. සැටක්පමණ භික්ෂූහු භාග්‍යවතුන්වහන්ස ප්‍රතිපත්ති පිරීම දුෂ්කරය අතිසයින් දුෂ්කරයයි කියා උපසම්පදා ශික්ෂාව හැර ගිහිවූවාහුය; සැටක්පමණ භික්ෂූන්ගේ සිත් කෙලෙස්නැමති සතුරන්ගෙන් විශෙෂයෙන් මිදුනාහුයයි වදාළසේක. මේ ධර්මදේශනාව මෙසේ ත්‍රිවිධ පුද්ගලයින්ටම සාර්ථකවූවාහුය; යම් සාමණේර නමක් හෝ උපසම්පදා නමක් හෝ දුස්සීලව සිට ශ්‍රද්ධාවන්තයින් විසින් දෙනලද සිව්පසය ප්‍රයෝජන ගැණීමෙන් ඔහු දෙලොවින්ම අනන්ත දුක්විඳින බව වදාරණලදි, දුස්සීලයෝයයි කියා සාමාන්‍යයෙන් කී පමණකින්ම ධර්මවිනය නොදන්නා අයට දුස්සීලවන්නෝ මේ මේ කාරණාවලින්ය කියා දැනගැණීම ඉතා දුෂ්කරය, එම නිසා ලොකාභිවෘද්ධිය පිණිස ඒ දුස්සීලවන කරුණු ස්වල්පයක් මෙහි දක්වනුලැබේ.

“දුස්සීලොති නිස්සීලො දූසිත සීලොති දුවිධො” මෙහි භාවය සරණසිල් පන්සිල් අටසිල් දසසිල් සාමණේර උපසම්පදා සීලාදී යම් සීලයක් තමාකෙරෙහි නැතිනිසාද පතිටාතිබෙන සීලය දූෂ්‍යනිසාද මේ දෙයංකාරයෙන්ම දුස්සීල නම් වේ. සිල් නැතිවීවනම් සරණසීලාදි සීලයක නොපිහිටීමෙන්ද පතිටා තුබූනුසිල් බිඳීමෙන්ද යන මේ ආකාර දෙකින්ම සිල් නැතිවන්නෝය; මෙහි දුස්සීලයෝ වනාහි ශ්‍රමණදුස්සීලයෝය ගිහිදුස්සීලයෝයයි ද්විප්‍රකාරවෙත්; එයින් ශ්‍රමණදුස්සීලයෝ ඡේද්‍යගාමි දුස්සීලයෝය, දූසිත දුස්සීලයෝයයි දෙකොටසෙක් වෙති; ඒ ඡේද්‍යගාමි දුස්සීලයෝ කවරේද? (1) මෛථුන පාරාජිකාවය, (2) අදත්තාදාන පාරාජිකාවය, (3) මනුෂ්‍ය විග්‍රහපාරාජිකාවය, (4) උත්තරිමනුෂ්‍යධර්ම පාරාජිකාවය යන මේ

සතරපාරාජිකාවට පැමිණි පුද්ගලයෝ ඡෙද්‍යගාමිණි දුස්සීලයෝ වෙති, මෛථුන පාරාජිකාවනම් සත්‍රීන් සේවනය කිරීමයි හෙවත් ලෝකාස්වාද රතියෙහි යෙදීමයි, අදත්තාදාන පාරාජිකාවනම් කයින් වචසින් නුදුන් අනුන් සන්තක මදට පසකබර රත්තරන් හෝ එපමණ වටිනා මුදලක් හෝ ඒ මුදල් වටිනා යම්කිසි වස්තුවක් හෝ සොරසිතින් ගැණීමයි, මනුෂ්‍යවිග්‍රහ පාරාජිකාවනම්—මරම් යන සිතින් දැන දැන යම් මනුෂ්‍යයෙක් මැරීම සහ යම්කිසි උපායකින් අනුන් ලවා මරවනබවයි, උත්තරිමනුෂ්‍ය ධර්මපාරාජිකාවනම් තමාකෙරෙහි පිහිටානැති ධ්‍යානවිමෝක්ෂමාර්ග ඵලාදි නැති ගුණයක් ලොවට ඇඟවීමයි, යන මේ පාරාජිකා සතරින් එකකටවත් යම් මහණෙක් පැමිණියේවීනම් ඉසකපාදූමු පුෂ්පයෙක් ජීවත්නොවන් නාක්මෙන් ඔහුගේ උපසම්පදාසීලය බිඳීමෙන් පාරාජිකාවට පැමිණෙන්නේය, ඔහට සරණසීලාදි කිසිගුණයක් නැතිහෙයින් ශාක්‍ය පුත්‍රයෙක්ද ශ්‍රමණයෙක්ද නොවන්නේය; ඒ පුද්ගලතෙම උපසම්පණ්ණය යන කල්පනාවෙන් ඒ ස්වභාවෙන්ම සිටියේවීනම් ඒකාන්තයෙන්ම මරණින්පසු භයානකවූ කටුක දුක්ඇති අවීචි ලෝකාන්තරිකාදී අපායවල ඉපිද නොයෙක් දුක්විඳින්නේය, යම් කෙනෙක් දැන දැන ඒ පුද්ගලයා සේවනය භජනය පයුරුපාසනයයි කියන කලින් කල ළඟට යාමද ළඟඉඳීම් වශයෙන් නැවත නැවත පැමිණීමද දෘෂ්ටානුගතියට පැමිණීමද ඔහට ගරුකාර සත්කාරාදිය කිරීම සහ සිව්පසයෙන් උපකාර කළේවීනම් ඒ උපකාරාදිය කළ පුද්ගලතෙම ඒ කාන්තයෙන්ම අපායෙහි උපදනේය; "නභජෙපාපකෙමිත්තෙ නභජෙ පුරිසාධමෙ" යනාදීන් ප්‍රාණඝාතාදි පව්කරණ පවිටු මිත්‍රයන් සේවනය නොකිරීමද, එක්විසි අනේෂණයට ඇතුළත් වෙදකම් නැකැත් වඩුකම් කිරීම් ආදි කුලදූෂණ කර්මකරණ අධම පුෂ්පයයි කියන ශ්‍රමණ දුස්සීලයන් සේවනය නොකිරීමද වදාරණලදී. යම් උපසම්පදා භික්ෂුනමක් ගණුදෙනු කිරීම වෙළඳාම් කිරීම නඩුහබකීම් ආදි ගිහිකර්මාන්තවල යෙදී සිටින්නේවීනම් ඔහුගේ උපසම්පදාව රක්ෂාවීම ඉතා දුෂ්කරවේ, එම නිසා ගණුදෙනු කිරීම් ආදි මිථ්‍යාප්‍රතිපදාවල යෙදීම භික්ෂුත්වට එපාකොට බුදුන් විසින් ප්‍රඥප්ති පනවාතිබේ.

දූසිත දුස්සීලයෝනම් තෙලෙස් සංඝාදිශේෂ තිසඟි පචිති දුශ්කට ආදි ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ආපත්තිවලට පැමිණ ප්‍රතිකර්මනොකොට එයින් නොනැගී සිල්දූශ්‍යවසිටින පුද්ගලයෝයි, යම් ප්‍රව්‍රජිත භික්ෂුනමක් සඞ්ඝාදි ශේෂාදි යම් කිසි ඇවතකට පැමිණ එයින් සුඩනොව කාලක්‍රියාකළේවීනම් ආපායොත්පත්ති වනබව දේශනාපෙළෙත්හිද ධම්පියා අටුවාවේ ඒරපත්තනාගරාජයාගේ කථාවස්තුවෙන්ද දතයුතුයි.

ඒ ශ්‍රමණදුඃශීලයින්ගේ ආදිනව විසුද්ධිමාර්ගයෙහිද දක්වා තිබේ, ඒ මෙසේයි:— "දුස්සීලො පුග්ගලො දුස්සීල්‍යහෙතු අමනාපො හොති දෙවමනුස්සානං න අනුසාසනීයො සබ්‍රහ්මචාරීනං දුක්ඛිතො දුස්සීල ගරහාසු විප්පටිසාරී සීලවතං පසංසා සුතායච පන දුස්සීලතාය සණ සාටකො විය දුබ්බණ්ණො හොති යෙ බො පනස්ස දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං දීඝරත්තං අපායදුක්ඛා වහනතො දුක්ඛසම්ඵස්සො යෙසං දෙය්‍යධම්මං පතිගණ්හාති තෙසං නමහප්ඵලං කාරණතො අප්පග්ඝො අනෙකවස්සගණික ගූථකූපොවිය දුබ්බිසොධො ඡවාලාතම්ව උභතො පරිබාහිරො භික්ඛුභාවං පටිජානන්තොපි අභික්ඛුයෙව ගොගණං අනුබන්ධ ගද්‍රභොවිය සතතුබ්බිග්ගො සබ්බවෙරි පුරිසොවිය අසංවාසාරහො මත කලෙබරං විය සුතාදිගුණයුත්තොපි සබ්‍රහ්මචාරීනං අපූජාරහො සුසානග්ගිවිය බ්‍රාහ්මණානං අභබ්බො විසෙසාධිගමෙ අන්ධොවරූපදස්සනෙ නිරාසො සද්ධම්මෙ චණ්ඩාලකුමාරකොවිය රජ්ජෙ සුඛිතොසම්හි මඤ්ඤමානොපි දුක්ඛිතො".—මෙහි භාවය, දුඃශීල තෙම තමාගේ දුඃශීලකම හෙතුකොටගෙණ දිව්‍යමනුෂ්‍යයන්ට අමනාපවෙයි, සබ්‍රංසරුන් විසින් පිළිකුල්කරණ බැවින් අනුශාසනාවට යුතුනොවෙයි, දුඃශීලයින්ට ගර්හාකරණකල්හි මමත් මෙබඳු ගර්හාවට යොග්‍යවීම් කියා තෙමේ දුකට පැමිණෙයි, සිල්වතුන්ට ප්‍රශංසාකරණකල්හි මම මෙබඳු ප්‍රශංසාවට අයොග්‍යවීම් සිතා තමාම කලකිරෙයි, ඒ දුඃශීලබව කරණකොට හණවැහිරියෙන් කළ රෙදි කඩක්මෙන් වර්ණය නැතිවෙයි, යම්කෙනෙක් වනාහි ඒ දුඃශීලයාගේ ලබ්ධියට පැමිණේද්ද ඔවුන්ට බොහෝකලක් අපාදුක් එලවන බැවින් දුඃඛස්ඵර්ශී ඇතිවෙයි, යම්කෙනෙකුන්ගේ දානවස්තු පිළිගෙණ ඔවුන්ට මහත්ඵල කරදීමට අසමර්ථ බැවින් මදක් අගනේයි, නොයෙක් අවුරුදු දහස්ගණනෙක්හි රැස්කරණලද අසූචිවලක්මෙන් පිරිසිදුකිරීමට නුපුළුවන්වෙයි, දෙකොන ගිණිගත් මැද අසූචි තැවරුණු සොහොන්පෙණෙල්ලක්මෙන් ශ්‍රමණ බවටද ගිහිබවටද නොගතයුතුවෙයි, මම භික්ෂූයෙම්යි කියා දත්වන්නේද මහණදම්නැති හෙයින් ශ්‍රමණයෙක් නොවෙයි, ගවසමූහයන් අනුවයන කොටළුවකුමෙන් නිරන්තරයෙන් කලකිරෙයි, සියලුදෙනාහට වයිරිපුද්ගලයෙකුමෙන් සිල්වතුන් විසින් නිතුකොට හරණ බැවින් සඞ්ඝකර්මාදියට සුදුසුනොවෙයි, මලවිණියක්මෙන් බහුස්සුතාදි ගුණයෙන් යුක්තවූයේද නොහොත් ත්‍රිපිටකධාරීවූයේද සබ්‍රම්සරුන්ගේ පූජාවට සුදුසුනොවෙයි, බ්‍රාහ්මණයන්ට සොහොන් ගින්නක්මෙන් මාර්ගඵලාදිගමයට අභව්‍යවෙයි, රූපදැකීමෙහි අන්ධපුද්ගලයෙකුමෙන් සද්ධර්මයෙහි ආසාවනැතිවෙයි රාජ්‍යපැතීමෙහි සැඬොල්කුමාරයෙකුමෙන් සැපයට පැමිණෙම් සිතත්නේද දුකටම පැමිණෙයි, මෙසේ සියල්ල ශ්‍රමණදුඃශීලයාගේ ආදිනවෝයි.

තවත් ශ්‍රමණ දුස්සීලයාගේ සහ ගිහිදුස්සීලයාගේ ආදීනව විස්තර කිරීමෙන් වාසගම වැඩිවනනිසා මෙපමණකින් නැවතුනෙමි. මෙසෙයින් දක්වනලද දුස්සීලභාවයෙහි සියළු ආදීනවයන් කල්පනාකොට පිරිසිදු නිර්මලවූ බුඩශාසනය දූශ්‍යනොකර ලෝකවාසීන් හා සමග තමනුත් අපායට නොපැමිණ ශාසනික පිළිවෙත් පුරණ්නට නොහැකිනම් ගෘහස්ථභූමියට පැමිණ තිසරණ පංචසීලාදිය රක්ෂාකිරීම යුතුබවද, ගෘහස්ථයන්විසින්ද දුස්සීලසේවනාදියෙන් දිෂ්ඨානුගතියට නොපැමිණ ස්වර්ගමෝක්ෂසම්පත් සාධාගැණීමට උත්සාහකටයුතුයි.

නිමි.

# අට්ඨකථායං.

තතියං අට්ඨුප්පත්තියං කථිතං කතරඅට්ඨුප්පත්තියං? අග්ගික්ඛන්ධොපම සුත්තන්ත අට්ඨුප්පත්තියං; භගවා කිරඑකස්මිං සමයෙ සාවත්ථිං උපනිස්සාය ජෙතවනමහාවිහාරෙ පටිවසති, බුද්ධානඤ්ච සබ්බකාලඤ්ච පටිවසන්තානං පඤ්චවිධං කිච්චං අවිජහිතමෙව හොති. පඤ්චවිධකිච්චානි පුරෙභත්තකිච්චං පච්ඡාභත්තකිච්චං පුරිමයාමකිච්චං මජ්ඣිමයාමකිච්චං පච්ඡිමයාම කිච්චන්ති තත්‍රිදං පුරෙභත්තකිච්චං, භගවාහි පාතොවඋට්ඨාය උපට්ඨාකානුග්ගහත්ථං සරීරඵාසුකත්ථඤ්ච මුඛධොවනාදි සරීරපරිකම්මං කත්වා යාව භික්ඛාචාරවෙලා තාව විවිත්තාසනෙ වීතිනාමෙත්වා භික්ඛාචාරවෙලායං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා චීවරං පාරුපිත්වා පත්තමාදාය කදාචි එකො කදාචි භික්ඛුසංඝ පරිවුතොගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති කදාචි පකතියා කදාචි අනෙකෙහි පාටිහාරියෙහි වත්තමානෙහි, සෙය්‍යථිදං පිණ්ඩාය පවිසතො ලොකනාථස්ස පුරතො පුරතො ගන්ත්වා මුදුගතයො වාතා පඨවිංසොධෙන්ති වලාහකා උදකඵුසිකානි මුඤ්චන්තාමග්ගෙරෙණුං වූපසමෙත්වා උපරිවිතානං හුත්වා තිට්ඨන්ති අපරෙවාතා පුප්ඵානි උපාහරිත්වා මග්ගෙ ඔකිරන්ති, උන්නතාභූමිප්පදෙසා ඔනමන්ති, ඔනතාඋන්නමන්ති, පාදනික්ඛෙපසමයෙ සමාභූමිහොති, සුඛසම්ඵස්සානි පදුමපුප්ඵානි වා පාදෙ සම්පටිච්ඡන්ති, ඉන්දඛීලස්ස අන්තොඨපිතමත්තෙ දක්ඛිණපාදෙ සරීරා ඡබ්බණ්ණරස්මියො නික්ඛමිත්වා සුවණ්ණ රසපිඤ්ජරානි විය චිත්‍රපට්ට පරික්ඛිත්තානි වියච පාසාදකූටාගාරාදීනි කරොන්ති යො ඉතොචිතොච විධාවන්ති, හත්ථිඅස්සවිහගාදයො සකසකට්ඨානෙසු ඨිතායෙව මධුරෙනාකාරෙන සද්දංකරොන්ති, තථාභෙරිවීණාදීනි තූරියානි මනුස්සානඤ්ච කායූපගානි ආභරණානි, තෙනසඤ්ඤාණෙන මනුස්සා ජානන්ති අජ්ජභගවා ඉධ පිණ්ඩාය පවිට්ඨොති, තෙසු නිවත්ථා සුපාරුතා ගන්ධපුප්ඵාදීනි ආදාය ඝරානික්ඛමිත්වා අන්තරවීථිං පටිපජ්ජිත්වා භගවන්තං ගන්ධපුප්ඵාදීනි සක්කච්චං පූජෙත්වා වන්දිත්වා අම්හාකං භන්තෙ දස භික්ඛූ අම්හාකං වීසති අම්හාකං භික්ඛු සතං දෙථාති යාචිත්වා භගවතොපි පත්තං ගහෙත්වා ආසනං පඤ්ඤපෙත්වා සක්කච්චං පිණ්ඩපාතෙන පතිමානෙන්ති, භගවා කතභත්තකිච්චො තෙසං සන්තානානි ඔලොකෙත්වා තථාධම්මං දෙසෙති යථාකෙචි සරණාගමනෙ පතිට්ඨහන්ති කෙචිපඤ්චසු සීලෙසු කෙචි සොතාපත්ති සකදාගාමි අනාගාමිඵලානං අඤ්ඤතරස්මිං කෙචිපබ්බජිත්වා අග්ගඵලෙ අරහත්තෙති, එවං මහා

ජනං අනුග්ගහෙත්වා උට්ඨායාසනා විහාරං ගච්ඡති, තත්ථ ගන්ධමණ්ඩ
ලමාළෙ පඤ්ඤත්තවරබුද්ධාසනෙ නිසීදති භික්ඛූනං භත්තකිච්චපරි
යොසානං ආගමයමානො. තතො භික්ඛූනං භත්තකිච්චපරියොසානෙ
උපට්ඨාකො භගවතො නිවෙදෙති, අථ භගවා ගන්ධකුටිං පවිසති, ඉදං
තාවපුරෙභත්තකිච්චං෴අථ භගවා එවං කතපුරෙ භත්තකිච්චො
ගන්ධකුටියා උපට්ඨානෙ නිසීදිත්වා පාදෙ පක්ඛාලෙත්වා පාදපීඨෙ ඨත්වා
භික්ඛුසඞ්ඝං ඔවදති, භික්ඛවෙ අප්පමාදෙන සම්පාදෙථ දුල්ලභො
බුද්ධුප්පාදො ලොකස්මිං දුල්ලභො මනුස්සත්තපටිලාභො දුල්ලභා
ඛණසම්පත්ති දුල්ලභා පබ්බජ්ජා දුල්ලභං සද්ධම්මසවනන්ති තත්ථ කෙචි
භගවන්තං කම්මට්ඨානං පුච්ඡන්ති, භගවා තෙසං චරියානුරූපං කම්ම
ට්ඨානං දෙති, තතො සබ්බෙපි භගවන්තං වන්දිත්වා අත්තනො අත්ත
නො රත්තිට්ඨාන දිවාට්ඨානානි ගච්ඡන්ති, කෙචි අරඤ්ඤං කෙචි රු
ක්ඛමූලං කෙචි පබ්බතාදීනං අඤ්ඤතරං කෙචි චාතුම්මහාරාජිකභව
නං෴පෙ෴කෙචි වසවත්තිභවනන්ති, තතො භගවා ගන්ධකුටිං පවිසි
ත්වා සචෙ ආකඞ්ඛති දක්ඛිණෙන පස්සෙන සතො සම්පජානො මුහු
ත්තං සීහසෙය්‍යං කප්පෙති, අථ සමස්සාසිතකායො උට්ඨහිත්වා දුති
යභාගෙ ලොකං ඔලොකෙති, තතියභාගෙ යං ගාමං වා නිගමං වා
උපනිස්සාය විහරති තත්ථ ජනො පුරෙභත්තං දානං දත්වා පච්ඡාභත්තං
සුනිවත්ථො සුපාරුතො ගන්ධපුප්ඵාදීනි ආදාය විහාරෙ සන්නිපතති,
තතො භගවා සම්පත්තපරිසාය අනුරූපෙන පාටිහාරියෙන ගන්ත්වා
ධම්මසභායං පඤ්ඤත්තවරබුද්ධාසනෙ නිසජ්ජ ධම්මං දෙසෙති, කාල
යුත්තං සමයයුත්තං අථකාලං විදිත්වා පරිසං උය්‍යොජෙති මනුස්සා
භගවන්තං වන්දිත්වා පක්කමන්ති, ඉදං පච්ඡාභත්තකිච්චං෴සො එවං
නිට්ඨිත පච්ඡාභත්තකිච්චො සචෙ ගත්තානි ඔසිඤ්චිතුකාමො හොති
බුද්ධාසනා උට්ඨාය න්හානකොට්ඨකං පවිසිත්වා උපට්ඨාකෙන පටියාදිත
උදකෙන ගත්තානි උතුං ගාහාපෙති, උපට්ඨාකොපි බුද්ධාසනං ආනෙ
ත්වා ගන්ධකුටිපරිවෙණෙ පඤ්ඤපෙති, භගවා රත්තදුපට්ටං නිවාසෙ
ත්වා කායබන්ධනං බන්ධිත්වා උත්තරාසඞ්ගං එකංසං කත්වා තත්ථ ආග
න්ත්වා නිසීදති එකකොව මුහුත්තං පටිසල්ලීනො, අථ භික්ඛූ තතො
තතො ආගම්ම භගවතො උපට්ඨානං ගච්ඡන්ති, තත්ථ එකච්චෙ පඤ්හං
පුච්ඡන්ති, එකච්චෙ කම්මට්ඨානං, එකච්චෙ ධම්මසවනං යාචන්ති,
භගවා තෙසං අධිප්පායං සම්පාදෙන්තො පුරිමයාමං වීතිනාමෙති,
ඉදං පුරිමයාමකිච්චං෴පුරිමයාමකිච්ච පරියොසානෙ පන භික්ඛූසු
භගවන්තං වන්දිත්වා පක්කන්තෙසු සකලදසසහස්සී ලොකධාතු දෙව
තා ඔකාසං ලභමානා භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති,
යථාභිසඞ්ඛතං අන්තමසො චතුරක්ඛරම්පි, භගවා තාසං දෙවතානං
පඤ්හං විස්සජ්ජෙන්තො මජ්ඣිමයාමං වීතිනාමෙති, ඉදං මජ්ඣිමයාම

කිච්චං. පච්ඡිමයාමං පන තයො කොට්ඨාසෙ කත්වා පුරෙගතතතො
පට්ඨාය නිසජ්ජාපීළිතස්ස සරීරස්ස කිලාසුභාව මොචනත්ථං එකං
කොට්ඨාසං චඞ්කමෙන වීතිනාමෙති, දුතියකොට්ඨාසෙ ගන්ධකුටිං පවි
සිත්වා දක්ඛිණෙන පස්සෙන සතො සම්පජානො සීහසෙය්‍යං කප්පෙති
තතියකොට්ඨාසෙ පච්චුට්ඨාය නිසීදිත්වා පුරිමබුද්ධානං සන්තිකෙ දාන
සීලාදිවසෙන කතාධිකාර පුග්ගලදස්සනත්ථං බුද්ධචක්ඛුනා ලොකං
ඔලොකෙති, ඉදං පච්ඡිමයාමකිච්චං. තංදිවසම්පි භගවා ඉමස්මිං
යෙව කිච්චෙ ඨිතො ලොකං ඔලොකෙන්තො ඉදං අද්දස මයා කොසල
රට්ඨෙ චාරිකාය චරන්තෙන අග්ගික්ඛන්ධෙන උපමෙත්වා එකස්මිං
සුත්තෙ දෙසිතෙ සට්ඨිභික්ඛූ අරහත්තං පාපුණිස්සන්ති සට්ඨිමත්තානං
උණ්හං ලොහිතං මුඛතො උග්ගච්ඡිස්සති සට්ඨිමත්තා ගිහිභාවං සඞ්කමි
ස්සන්ති, තත්ථ යෙ අරහත්තං පාපුණිස්සන්ති තෙ යං කිඤ්චිධම්මදෙසනං
සුත්වා පාපුණිස්සන්තෙව, ඉතරෙසං පන භික්ඛූනං සඞ්ගහත්ථාය චාරි
කං චරිතුකාමො හුත්වා ආනන්ද භික්ඛූනං ආරොචෙහීති ආහ. ථෙරො
අනුපරිවෙණං ගන්ත්වා ආවුසො සත්ථා මහාජනස්ස සඞ්ගහත්ථාය චාරි
කංචරිතුකාමො ආගන්තුකාමා ආගච්ඡන්තූති ආහ, භික්ඛූ මහාලාභං
ලභිත්වා විකසිතමානසා ලභිස්සාම වත මහාජනස්ස ධම්මං දෙසෙ
න්තස්ස භගවතො සුවණ්ණවණ්ණං සරීරං ඔලොකෙතුං මධුරච
ධම්මකථං සොතුන්ති පරූළ්හකෙසා කෙසොහාරාපෙත්වා මලග්ගහි
තත්තා පත්තපචිත්වා කිලිට්ඨචීවරානි ධොවිත්වා ගමනසජ්ජා
අහෙසුං, සත්ථා අපරිච්ඡින්නෙන භික්ඛුසඞ්ඝෙන පරිවුතො කොසල
රට්ඨෙ චාරිකාය නික්ඛන්තො ගාමනිගමපටිපාටියා එකදිවසං ගාවුතං
අඩ්ඪයොජනං තිගාවුතං යොජනපරමං චාරිකං චරන්තො එකස්මිං
පදෙසෙ මහන්තං සුසිරරුක්ඛං අග්ගිනා සම්පජ්ජලිතං දිස්වා ඉම
මෙව වත්ථුං කත්වා සත්තඞ්ගි අඞ්ගපටිමණ්ඩිතං ධම්මදෙසනං
කථෙස්සාමීති ගමනං පච්ඡින්දිත්වා අඤ්ඤතරං රුක්ඛමූලං උපසඞ්කමි
ත්වා නිසජ්ජාකාරං දස්සෙසි, ආනන්දත්ථෙරො සත්ථු අධිප්පායං ඤත්වා
අද්ධා කාරණං භවිස්සති න අකාරණෙ තථාගතා ගමනං පච්ඡින්දිත්වා
නිසීදන්තීති; චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙසි, සත්ථා නිසීදිත්වා භික්ඛූ
ආමන්තෙත්වා "පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛ
න්ධං" ති අග්ගික්ඛන්ධොපම සුත්තන්තං දෙසෙසි, ඉමස්මිං ච පන
වෙය්‍යාකරණෙ භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං උණ්හං ලො
හිතං මුඛතො උග්ගඤ්ඡි, සට්ඨිමත්තා භික්ඛූ සික්ඛං පච්චක්ඛාය හීනා
යාවත්තිංසු, සට්ඨිමත්තානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි
විමුච්චිංසු, තංහිවෙය්‍යාකරණං සුත්වා සට්ඨිමත්තානං භික්ඛූනං නාම
කායො සන්තත්තො නාමකායෙ සන්තත්තෙ කරජකායො සන්ත
ත්තො කරජකායෙ සන්තත්තෙ නිධානගතං උණ්හං ලොහිතං


මුඛතො උග්ගඤ්ඡි, සට්ඨිමත්තා භික්ඛූ දුක්කරං භගවාසු දුක්කරං
භගවා බුද්ධසාසනෙ යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං
චරිතුන්ති සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තා, සට්ඨිමත්තා භික්ඛූ සද්ධ
දෙසනාභිමුඛං ඤාණං පෙසෙත්වා සහපටිසම්භිදාහි අරහත්තං පත්තා,
තත්ථ යෙසං උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡි තෙ පාරාජිකං ආප
ජ්ජිංසු, යෙ ගිහිභාවං පත්තා තෙ ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි මද්ද
න්තා විචරිංසු, යෙ අරහත්තං පත්තා තෙ පරිසුද්ධසීලාව අහෙසුං,
සද්ධම්මදෙසනා ඉමෙසං තිණ්ණම්පි සඵලාව ජාතා, අරහත්තං පත්තා
නං තාව සඵලාහොතු ඉතරෙසං කථං සඵලාජාතාති? තෙපිහි සචෙ
ඉමං ධම්මදෙසනං නසුණෙය්‍යුං පමත්තා හුත්වා ඨානං ජහිතුං නසක්කු
ණෙය්‍යුන්ති තතො තෙසං තංපාපං වඩ්ඪමානං අපායෙසු යෙව සංසීද
පෙය්‍ය, ඉමං පන දෙසනං සුත්වා ජාතසංවෙගා ඨානං ජහිත්වා සාම
ණෙරභූමියං ඨිතා දසසීලානි පූරෙත්වා යොනිසොමනසිකාරෙ යුත්ත
පයුත්තා කෙචිසොතාපන්නා කෙචිසකදාගාමිනො කෙචිඅනාගාමිනො
අහෙසුං, කෙචි දෙවලොකෙ නිබ්බත්තිංසු එවං පාරාජිකා පන්නානම්පි
සඵලා අහොසි, ඉතරෙ පන ඉමං ධම්මදෙසනං න සුණෙය්‍යුං ගච්ඡ
න්තෙ ගච්ඡන්තෙ කාලෙ සංඝාදිසෙසම්පි පාරාජිකම්පි ආපජ්ජෙය්‍යුං,
ඉමං පන දෙසනං සුත්වා අහොසල්ලෙඛිතං බුද්ධසාසනං නසක්කා අම්හෙ
හි යාවජීවං ඉමං පටිපත්තිං පූරෙතුං සික්ඛං පච්චක්ඛාය උපාසකධ
ම්මං පූරෙත්වා දුක්ඛාමුච්චිස්සාමාති ගිහිභාවං උපසංකමිංසු, තෙතීසුසර
ණෙසු පතිට්ඨාය පඤ්චසීලානි රක්ඛිත්වා උපාසකධම්මං පූරෙන්තා
කෙචි සොතාපන්නා කෙචි සකදාගාමිනො කෙචි අනාගාමිනො ජාතා
කෙචි දෙවලොකෙ නිබ්බත්තාති, එවං තෙසම්පි සඵලාව අහොසි.
ඉමංපනසද්ධම්මදෙසනං සුත්වා දෙවසඞ්ඝායෙහිපි සුත්තායෙහිපි නසුත්වා
සබ්බසංයෙව ආරොචෙන්තාව විචරිංසු, භික්ඛුසුත්වා සුත්වා දුක්කරං
හො බුද්ධානං සාසනෙ යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතු
න්ති එකක්ඛණෙ නෙවදසපි භික්ඛූ වීසතිම්පි සට්ඨිම්පි සතම්පි සහස්ස
ම්පි භික්ඛූ ගිහිහොන්ති සත්ථා යථාරුචියා චාරිකං චරිත්වා පුන ජෙත
වන මෙව ආගන්ත්වා භික්ඛූ ආමන්තෙසි භික්ඛවෙ තථාගතො චාරිකං
චරමානො චිරං ආකිණ්ණවිහාසි ඉච්ඡාමහං භික්ඛවෙ අඩ්ඪමාසං පටි
සල්ලීයිතුං නම්හි කෙනචි උපසංකමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩ
පාතනීහාරකෙන නාති, අඩ්ඪමාසං එකීභාවෙන විහිනාමෙත්වා පටිසල්ලා
ණා වුට්ඨිතො ආනන්දත්ථෙරෙන සද්ධිංවිහාරචාරිකං චරමානො ඔලො
කිතො ලොකිතට්ඨානෙ පතානුභූතං භික්ඛුසංඝං දිස්වා ජානන්තො යෙ
වථෙරංපුච්ඡි, ආනන්ද අඤ්ඤදස්මිං කාලෙතථාගතෙ චාරිකංචරිත්වා ජෙ
තවනං ආගතෙ සකලවිහාරො කාසාවපජ්ජොතො ඉසිවාත පරිවා
තොහොති ඉදානිපනපතනුභූතොභික්ඛුසංඝොදිස්සති යෙභුය්‍යානෙව

උප්පණ්ඩුප්පණ්ඩුකජාතා භික්ඛූ කිං නු ඛො එතන්ති? භගවා තුම්හාකං
අග්ගික්ඛන්ධොපමං ධම්මදෙසනං කථිතකාලතො පට්ඨාය භික්ඛුසංවෙ
ගප්පත්තා හුත්වා මයං එතං ධම්මං සබ්බප්පකාරෙන පූරෙතුං න සක්ඛි
ස්සාම අසම්මාවත්තන්තානඤ්ච ජනස්ස සද්ධාදෙය්‍යං පරිභුඤ්ජිතුං අයු
ත්තන්ති ගිහිභාවං සංකමන්තීති, තස්මිං ඛණෙ භගවතො ධම්මසංවෙ
ගො උප්පජ්ජි, තතො ථෙරං ආහ "මයිපටිසල්ලානෙන වීතිනාමෙ
න්තෙන නාමකොචි මම පුත්තානං ඒකං අස්සාසට්ඨානං කථෙසි, සා
ගරස්සහි ඔතරණතිත්ථානි විය බහූනි ඉමස්මිං සාසනෙ අස්සාස කාරණා
නි, ගච්ඡානන්ද ගන්ධකුටිපරිවෙණෙ බුද්ධාසනං පඤ්ඤාපෙත්වා භික්ඛුසං
ඝං සන්නිපාතෙහි" ති ථෙරො තථා අකාසි සත්ථා බුද්ධාසනවරගතො
භික්ඛූ ආමන්තෙත්වා "භික්ඛවෙ මෙත්තාය සබ්බපුබ්බභාගො නාම
නෙව අප්පනා න උපචාරො සත්තානංහිතඵරණමත්තමෙවාති"
වත්වා ඉමිස්සා අට්ඨුප්පත්තියා ඉමං චූළඅච්ඡරා සංඝාතසුත්තං දෙසෙසි
තත්ථ අච්ඡරාසංඝාතමත්තන්ති, අච්ඡරාපහරණමත්තං; ද්වෙ අඞ්ගුලි
යො පහරිත්වා සද්දකරණමත්තන්ති අත්ථො; මෙත්තං චිත්තන්ති, සබ්බ
සත්තානං හිතඵරණචිත්තං; ආසෙවතීති, කථං ආසෙවති? ආවජ්ජෙ
න්තො ආසෙවති ජානන්තො ආසෙවති පස්සන්තො ආසෙවති
පච්චවෙක්ඛන්තො ආසෙවති සද්ධාය අධිමුච්චන්තො ආසෙවති
විරියං පග්ගණ්හන්තො ආසෙවති සතිං උපට්ඨාපෙන්තො ආසෙ
වති චිත්තං සමාදහන්තො ආසෙවති පඤ්ඤාය පජානන්තො ආසෙ
වති අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො ආසෙවති පරිඤ්ඤෙය්‍යං පරි
ජානන්තො ආසෙවති පහාතබ්බං පජහන්තො ආසෙවති භාවෙ
තබ්බං භාවෙන්තො ආසෙවති සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො
ආසෙවතීති; ඉධපනමෙත්තා පුබ්බභාගෙන හිතඵරණපවත්ත නම
ත්තෙනෙව ආසෙවතීති වෙදිතබ්බා; අරිත්තජ්ඣානොති, අතුච්ඡ
ජ්ඣානො; අපරිච්චත්තජ්ඣානො වා; විහරතීති, ඉරියතිපවත්තෙති
පාලෙතියපෙතියාපෙති චරති විහරති, තෙනවුච්චති විහරතීති; ඉමි
නාපදෙන මෙත්තං ආසෙවන්තස්ස භික්ඛුනො ඉරියාපථවිහාරො
කථිතො, සත්ථුසාසන කරොති, සත්ථුඅනුසාසනිකරො; ඔවාදපතික
රොති, ඔවාදකාරකො; එත්ථ සකිං වචනං ඔවාදො පුනප්පුන වචනං
අනුසාසනී, සම්මුඛාවචනම්පි ඔවාදො, පෙසෙත්වා පරම්මුඛා වචනං
අනුසාසනී, ඔතිණ්ණෙ වත්ථුස්මිං වචනං ඔවාදො, ඔතිණ්ණෙ වා
අනොතිණ්ණෙ වා තන්තිඨපනවසෙන වචනං අනුසාසනී, එවං විසෙ
සො වෙදිතබ්බො පරමත්ථතො පන ඔවාදොති වා අනුසාසනීති වා
එසෙ එකෙ එකට්ඨෙ සමෙසමභාගෙ තජ්ජාතෙ තඤ්ඤෙවාති එත්ථ
" අච්ඡරා සංඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛුමෙත්තං චිත්තං ආසෙ
වතීති " ඉධමෙව සත්ථුසාසනඤ්චෙව ඔවාදො ච, තස්සකරණතො එසො

සනකරො ඔවාද පතිකරොනි වෙදිතබ්බා අමොඝනාහි, අතුච්ඡං; රට්ඨපිණ්ඩන්ති, ඤාතිපරිවට්ටං පහාය රට්ඨං නිස්සාය පබ්බජිතෙන පරෙසං ගෙහතො ලද්ධත්තා පිණ්ඩපාතො රට්ඨපිණ්ඩො නාමවුච්චති පරිභුඤ්ජන්තීති, චත්තාරො පරිභොගා ථෙය්‍යපරිභොගො ඉණපරිභොගො දායජ්ජපරිභොගො සාමිපරිභොගොති, තත්‍ථ දුස්සීලස්ස පරිභොගො ථෙය්‍යපරිභොගො නාම, සීලවතො අපච්චවෙක්ඛිත පරිභොගො ඉණපරිභොගො නාමසත්තන්නං සෙඛානං පරිභොගො දායජ්ජපරිභොගො නාම, ඛීනාසවස්ස පරිභොගො සාමිපරිභොගො නාම, තත්‍ථ ඉමස්ස භික්ඛුනො අයං රට්ඨපිණ්ඩ පරිභොගො චීහිකාරණෙහි අමොඝොහොති අච්ඡරාසංඝාතමත්තං කාලං මෙත්තං ආසෙවන්තො භික්ඛු රඨපිණ්ඩස්ස සාමිහුත්වා අනණො හුත්වා දායාදකො හුත්වා පරිභුඤ්ජතීති පිස්සඅමොඝොරට්ඨපිණ්ඩපරිභොගො, අච්ඡරා සංඝාතමත්තම්පි මෙත්තං ආසෙවන්තස්ස භික්ඛුනො දිනනං දානං මහට්ඨියං හොති මහප්ඵලං මහානිසංසං මහාජුතිකං මහාවිප්ඵාරන්ති පිස්ස අමොඝො රට්ඨපිණ්ඩපරිභොගො කොපනවාදෙ යෙනං බහුලීකරොන්තීති, යෙපන ඉදං මෙත්තං චිත්තං බහුලං අසෙවන්ති භාවෙන්ති පුනප්පුන කරොන්තිතෙ අමොඝං රට්ඨපිණ්ඩං පරිභුඤ්ජන්තීති එත්‍ථ වත්තබ්බමෙවකිං? එවරූපාහි භික්ඛු රට්ඨපිණ්ඩස්ස සාමිනො අණනා දායාදහුත්වා පරිභුඤ්ජන්තීති.—

අට්ඨකථායං නිට්ඨිතං.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු